# සුවෙන් පෙරට

# e ඉගෙනුම් පියස

# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

වාරය : 3 වාරය

ශ්‍රේණිය : 12 ශ්‍රේණිය

විෂයය : ව්‍යාපාර අධ්‍යයනය

පාඩම : විදේශ වෙළෙඳාම

# ව්‍යාපාර අධ්‍යයනය
# 12 ශ්‍රේණිය

# විදේශ වෙළෙඳාම






## නිපුණතාව 11
## නිපුණතා මට්ටම 11.4

# විදේශ වෙළෙඳාම හැඳින්වීම








- යම් රටක් වෙනත් රටක් හෝ රටවල් සමඟ සිදුකරන වෙළෙඳාම විදේශ වෙළෙඳාම වේ.

# විදේශ වෙළෙඳාමට පදනම් වන සාධක

- **ස්වභාවික සම්පත් බෙදීයාමේ විෂමතාව**

යම් යම් රටවලට සමහර ස්වභාවික සම්පත් උරුම වී ඇති ආකාරය විෂම වීම නිසා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සිදුකළ හැක්කේ එම රටවලට පමණි.

උදා: මැදපෙරදිග- ඛනිජ තෙල්
ද.අප්‍රිකාව- රත්‍රන්
ශ්‍රී ලංකාව-තේ

- **සාපේක්ෂ පිරිවැය වාසිය**

රටක් භාණ්ඩ ආනයනය කිරීමට සාපේක්ෂව අඩු පිරිවැයකින් නිපදවිය හැකිනම් එම භාණ්ඩ නිපදවා අපනයනය කළ යුතු බවත්,භාණ්ඩය නිපදවීමට සාපේක්ෂව අඩු පිරිවැයකින් ආනයනය කළ හැකිනම් එම භාණ්ඩ ආනයනය කළ යුතු බවත් මින් අදහස් වේ.

උදා: ශ්‍රී ලංකාව-ඇඟළුම් නිෂ්පාදනය

- **සමහර නිෂ්පාදිත සම්බන්ධව සමහර රටවල නීතිමය ඒකාධිකාරයක් තිබීම.**

සමහර නිෂ්පාදන සඳහා අවශ්‍ය නිපුණතාව හා තාක්ෂණය සෑම රටකටම නොමැති වීම හෝ සීමා වීම.

උදා: රොබෝ තාක්ෂණය ,මෝටර් රථ තාක්ෂණය

- **භාණ්ඩ ප්‍රවර්ධනය**

තම නිෂ්පාදිත ලොව පුරා අලෙවි කර ගැනීම සඳහා විවිධ ප්‍රවර්ධන ක්‍රම භාවිතා කිරීම.

- **වෙළඳ බාධක අවම වීම**

වෙළෙඳාම සඳහා තිබූ තීරු බදු හා තීරු බදු නොවන සම්බාධක බොහොමයක් ඉවත් වීම.

# විදේශ වෙළෙඳාමේ ප්‍රභේද



## ආනයන වෙළෙඳාම

කිසියම් රටක් විදේශ රටකින් හෝ රටවලින් භාණ්ඩ හා සේවා ගෙන්වීම

උදා:ශ්‍රී ලංකාවට ජපානයෙන් මෝටර් රථ ගෙන්වීම




## අපනයන වෙළෙඳාම

කිසියම් රටක් විදේශ රටකට හෝ රටවලට භාණ්ඩ හා සේවා යැවීම

උදා:ශ්‍රී ලංකාවෙන් ඉරාකයට තේ යැවීම



## ප්‍රතිඅපනයන

කිසියම් රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට ගෙනැවිත් වෙනසකට භාජනය කර හෝ නොකර නැවත වෙනත් රටකට හෝ රටවලට යැවීම

උදා: රෙදිපිළි සහ අනෙකුත් දෑ ආනයනය කර ඇඟලුම් සකස් කර වෙනත් රටකට අපනයනය කිරීම




## අන්තරාල වෙළෙඳාම

කිසියම් රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට නොගෙන වරාය තුළ නැවත සකසා හෝ සැකසීමකින් තොරව නැවත වෙනත් රටකට හෝ රටවලට අපනයනය කිරීම

උදා: ශ්‍රී ලංකාවට ඉන්දියාවෙන් තේ ආනයනය කර ඉරානයට අපනයනය කිරීම

# විදේශ වෙළෙඳාමේ ප්‍රතිලාභ

- අතිරික්ත නිෂ්පාදිත අපනයනය කල හැකි වීම.
- රටෙ නිපදවිය නොහැකි නිෂ්පාදිත ආනයනය කල හැකි වීම.
- විදේශ විනිමය උපයා ගත හැකි වීම.
- ආර්ථික පිරිමැසුම් අත්කර ගත හැකි වීම.
- ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා හා ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය වීම.
- නව තාක්ෂණික හා කළමණාකරණ නිපුණතා වර්ධනය වීම.
- ආර්ථික සංවර්ධනයට පිටුවහලක් වීම.

උදා:රැකියා උත්පාදනය,ජනතාවගේ ජීවන මට්ටම උසස් වීම,සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම.

# නිදහස් වෙළෙඳාම

- කිසිදු බාධාවකින් තොරව විවිධ පාර්ශ්වයන්ට නිදහසේ භාණ්ඩ ආනයනය හා අපනයනය කිරීමට අවකාශයක් පැවතීමයි.

නිදහස් වෙළෙඳාමට ඇති බාධක

**<u>තීරු බදු බාධක</u>**

රටවල් අතර වෙළෙඳාමේදී තීරු බදු පැනවීම නිදහස් වෙළෙඳාමට බාධාවකි.

**<u>තීරු බදු නොවන බාධක</u>**

- ✓ ආනයන සීමා කිරීම/පංගු කිරීම
- ✓ අපනයන සීමා කිරීම/පංගු කිරීම
- ✓ ආනයන /අපනයන තහනම් කිරීම
- ✓ වෙළෙඳ ගිවිසුම්
- ✓ දැඩි විනිමය ප්‍රතිපත්ති